# දරුවන් උදෙසා බයිබලයක්

## පාස්කුව



ඉදිරිපත් කරන්නා: Edward Hughes

නිදර්ශනය කරන්නා: Janie Forest
Alastair Paterson

සකස්කරන්නා: Lyn Doerksen

අදහසක් වඩා සරල ස්වරූපයකින් ප්‍රකාශ කරන්නා

නිෂ්පාදනය කරන්නා: Bible for Children
www.M1914.org

©2020 Bible for Children, Inc.
අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර ඇතිමුත් එය විකිණීමට අවසර නැත.

තම පුතු මියැදෙන දෙස බලා සිටින කාන්තාවකි. ඇගේ දෑස් එම රුදුරු දසුන දෙස යොමු වී ඇත. මහා කලබලයක් සහිත කඳු මුදුනකි. එම කාන්තාව මරියා ය. ඇය බලා සිටියේ ජේසුස් වහන්සේගේ කුරුසියේ ඇණ ගැසුම් කා මියයන දෙසය.





මේ සියල්ල සිදු වූයේ කෙසේද?
ජේසුස් වහන්සේගේ අලංකාර
ජීවිතය මේ ආකාරයෙන්
අවසන් වූයේ කෙසේද?
දෙවියන් වහන්සේ,
උන් වහන්සේගේ
එකම පුතණුවන්
කුරුසියේ ඇණ
ගසා මිය යන්නට
ඉඩ හැරියේ කෙසේද?
ජේසුස් වහන්සේ අතින්
යම්කිසි වරදක් වුණා
ද? දෙවියන් වහන්සේ
පරාජිත වූවා ද?



නැහැ! දෙවියන් වහන්සේ
පරාජිත වූයේ නැත. ජේසුස්
වහන්සේ අතින් වරදක් වූයේ
ද නැත. නපුරු මිනිසුන් ජේසුස්
වහන්සේ මරණයට පත් කරන
බව උන් වහන්සේ සැම
වේලේම දැන සිටියා. ජේසුස්
වහන්සේ ළදරුවකුව සිටියදී
පවා මහලු සිමියොන් පැවසූයේ
''අනාගතයේදී ශෝකයට පත්
වන්නට මරියාට සිදු වන
බවයි.''

ජේසුස්
වහන්සේ
මරණයට
පත් කිරීමට දින
කිහිපයකට පෙර
කාන්තාවක් පැමිණ
සුවඳ විලවුන් ගෙන
ජේසුස් වහන්සේගේ පාද
පිස දැමුවාය. ශ්‍රාවකයෝ
චෝදනා කරමින් ''ඇය
මුදල් නාස්ති කරනවා''
යැයි කොඳුලෝය. නමුත් ජේසුස්
වහන්සේ කීවේ ''ඇය කළ ක්‍රියාව
යහපත් බවත්, ඇය තමන් වහන්සේ භූමදානයට
සූදානම් කළ බවත් ය. කෙතරම් පුදුම වචන ද?



ජේසුස් වහන්සේ ජුදෙව්වන්ගේ පාස්කු මංගල්‍ය සමයේදී උන් වහන්සේගේ.





ගෝලයන් සමඟ අවසාන
ආහාර වේල බුක්ති වින්දා. උන්
වහන්සේට ආදරය කරන අයට
දෙවියන් වහන්සේ සම්බන්ධ ඉතා
වටිනා පොරොන්දු දුන්නා. ජේසුස්
වහන්සේගේ රොටී හා කුසලාන ද
දුන්නා. මෙය ජේසුස් වහන්සේගේ
ශරීරයත් රුධිරයත් පාපය
වෙනුවෙන් දුන් බව
මතක් කිරීමකි.

එවිට ජේසුස් වහන්සේ තම මිතුරන්ට වදාළේ, ''උන් වහන්සේ පාවා දෙනු ලබන බවත්, ඔවුන් උන් වහන්සේ වෙතින් පලායන බවත් ය. ''මම ඔබෙන් පලා නොයමි'' යි එවිට පේදුරු පැවසුවා. ජේසුස් වහන්සේ ඔහු වෙත හැරී, ''නුඹ නුඹ මා හඳුනන්නේ නැත කියා තුන් වරක් කියන තුරු, අද කුකුළා හඬලන්නේ නැත'' යි වදාළ සේක.





පසුව රාත්‍රියේදී ගෙත්සෙමන
උයනට ජේසුස් වහන්සේ
යාච්ඤා කිරීමට ගියා. ඔහු
සමඟ සිටි ගෝලයන් නිදා
ගන්නට විය. ජේසුස්
වහන්සේ යාච්ඤා කරමින්,
''මාගේ පියාණෙනි, ඔබ
කැමති ලෙස මේ කුසලාන
මාගෙන් පහ කළ මැනව,
එහෙත් මාගේ කැමැත්ත
නොව ඔබගේ කැමැත්ත
වේවා'' යයි කී සේක.

ජුදස්ගේ නායකත්වයෙන් අනපේක්ෂිත ලෙස
කලබලකාරී කණ්ඩායමක් උයන වෙත පැමිණියා.
ජේසුස් වහන්සේ ඔවුනට විරෝධය පැවේ නැත.
නමුත් පේදුරු මනුෂ්‍යයකුගේ කණ කැපුවා.
ජේසුස් වහන්සේ මනුෂ්‍යයාගේ කන
ස්පර්ශ කොට සුව කළා. ජේසුස්
වහන්සේ දැන සිටියා, තමන්
අත් අඩංගුවට පත්වීම
දෙවියන් වහන්සේගේ
කැමැත්ත බව.



මෙම කලබලකාරී කණ්ඩායම විසින් ජේසුස් වහන්සේ
උත්තම පූජකයාගේ නිවසට ගෙනගියා. එහි සිටි ජුදෙව් නායකයන්
පැවසුවේ, ජේසුස් වහන්සේ
මරණයට නියම විය යුතු
බවයි. උණුසුම් වීම සඳහා
අසලින් තිබුණු ගිනි මැලය
ළඟ සිටි පේදුරු තුමා
එදෙස බලා සිටියා.



තුන් වරක් මිනිසුන් පේදුරු දෙස බලමින් කියනුයේ,
ඔහු ද ජේසුස් වහන්සේ ළඟ සිටි බවයි. ජේසුස් වහන්සේ පැවසූ
ලෙසම තුන් වතාවේම පේදුරු
ජේසුස් වහන්සේ නාඳුනන
බව කීවේය. එපමණක්
නොව, ඔහු දිවුරමින්
එසේ පැවසුවේය.



# කුකුළා ඝෝෂාවකට...



ඒ මොහොතේදීම කුකුළා තුන්
වරක් හැඬලුවේය. කුක්-- කු--
කු-- කු පේදුරුට එය දෙවියන්
වහන්සේගේ හඬ මෙන් විය.
ජේසුස් වහන්සේ කියූ වදන්
සිහිවී ඔහු හඬා වැළපුණේය.



මේ අතර ජූදස් ද පසුතැවෙමින්
සිටියා. ජේසුස් වහන්සේ තුළ
කිසිදු වරදක් හෝ පාපයක්
නොමැති බව ඔහු දැන සිටියා.
රිදී කාසි 30 ඔහු නැවත ගෙන
ගියා. නමුත් පූජකයන් එය
ආපසු බාර ගත්තේ
නැහැ.



ජූදස් එම මුදල්
විසිකර දමා ඉවත
ගොස් එල්ලී
මැරුණේය.



නායක පූජකයන් විසින් ජේසුස් වහන්සේ
පිලාත් නම් රෝම ආණ්ඩුකාරවරයා
ඉදිරියට ගෙන ඒම ''මේ මනුෂ්‍යයා
අත කිසි වරදක් පෙනෙන්නට නැතැ'' යි
පිලාත් කීවේය. නමුත්
කලබලකාරී කණ්ඩායම
කෑ ගසමින්, ''කුරුසියේ
ඇණ ගසන්න, කුරුසියේ
ඇණ ගසන්නැ'' යි කීහ.

පිලාත්ගේ අවසාන තීරණය වුණේ ජේසුස් වහන්සේ කුරුසියේ ඇණ ගසන්නට අවසර දීමයි. සොල්දාදුවෝ ජේසුස් වහන්සේට මොට්ට ආයුධයකින් පහර දුන්නා. මුහුණට කෙළ ගැසුවා. කස පහර ගැසුවා. කටු ගසක ඉතා තියුණු දිග කටු සහිත ඔටුන්නක් සාදා එය ජේසුස් වහන්සේගේ හිසෙහි තබා ඇතුළට තද කළා. ඉන්පසු උන් වහන්සේ ලී කුරුසයක තබා ඇණ ගසා මරණයට පත් කරනු ලැබුවා.



ඒ ආකාරයට තම ජීවිතේ පුදන්න සිදුවන බව ජේසුස් වහන්සේ හොඳින්ම දැනසිටියා. එමෙන්ම ජේසුස් වහන්සේගේ මරණයේ පූජාවෙන් උන් වහන්සේ කෙරෙහි අදහන සියලු දෙනාට පාපවලට කමාව ලැබෙන බව දැන සිටියා. ජේසුස් වහන්සේ දෙපස අපරාධ කරුවන් දෙදෙනෙක් කුරුසි පත්ව සිටියා. එක් අයෙක් ජේසුස් වහන්සේ විශ්වාස කළ නිසා ඔහුට පාරාදිසයට යන්නට හැකි වුණා. අනෙක් තැනැත්තා එසේ කළේ නැත.



පැය ගණනක් වේදනා විඳීමෙන් පසුව,
ජේසුස් වහන්සේ ''සියල්ල නිමා විය''
යි පවසමින් මරණයට පත් වූ
සේක. උන් වහන්සේගේ
කාර්යය සම්පූර්ණ විය.
මිතුරන් විසින් රහස්‍ය
සොහොනක උන්
වහන්සේ තැන්පත්
කරන ලදී.



කිසිවකුට සොහොනෙන්
පිටතට හෝ ඇතුළට යා
නොහැකි ලෙස වසා මුද්‍රා
තබා රෝම සොල්දාදුවන්
විසින් එය මුර කරනු
ලැබුවා.



අවසානය මෙය නම් එය කෙතරම්
ඛේදජනක ද? එහෙත් දෙවියන්
වහන්සේ ඓශ්වර්යමත්
දෙයක් කළ සේක.
ජේසුස් වහන්සේ
මරණය පරදා
ජයගත් සේක.





සතියේ පළමු දින උදෑසන ජේසුස්
වහන්සේගේ ගෝලයෝ කිහිප දෙනෙක්
දුටුවා, සොහොන් ගල පෙරළී
තිබුණු ආකාරය. ඔවුහු
සොහොන තුළ කිසිවක්
දුටුවේ නැත. ජේසුස්
වහන්සේ තව දුරටත්
සොහොන් ගෙය
තුළ සිටියේ නැත.

එක් කාන්තාවක් සොහොන ළඟ අඬමින් සිටියා. ජේසුස් වහන්සේ ඇයට දර්ශනය වුණා. මෙම පණිවුඩය ගෝලයන්ට කීමට ඇය කලබලයෙන් හා ප්‍රීතියෙන් දිව ගියා. ''ජේසුස් වහන්සේ ජීවමානයි, උන් වහන්සේ මරණය පරාජය කළා.'' යැයි ඇය සාක්ෂි දුන්නා.





ජේසුස් වහන්සේ ඉක්මනින් ගෝලයන් වෙතට පැමිණ ඇණ ගසනු ලැබූ තුවාළ පෙන්නුවා. එය සත්‍යයයි. ජේසුස් වහන්සේ ජීවමානයි. උන් වහන්සේ නාඳුනන බව කී පේදුරුට සමාව දී ගෝලයන්ට පැවසුවේ ජේසුස් වහන්සේ ගැන අන් අයට කියන ලෙසයි. පළමු නත්තලේදී උන් වහන්සේ මෙලොවට එන්නට පෙර සිටි ස්වර්ගයටම නැවතත් මෙලොවින් පිටව ගිය සේක.

පාස්කුව

දේව වචනයෙන් එක් කථාවක්

බයිබලයේ

මතෙව් 26-28; ලූක් 22-24; ජොහන් 13-21

''ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ''
ගීතාවලිය 119:130

# අවසානය

මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සෑදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.

දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහො සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වු සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැගිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත. ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.

මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.

ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජීවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.

දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)